ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

**11 ශ්‍රේණිය** | **රංගකලාව - II** | **කාලය පැය දෙකයි.**

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. විකෘති නාට්‍ය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  i. විකෘති නාට්‍ය කාගේ නිෂ්පාදනයක් ද?
  ii. මෙම නාට්‍යයේ පළමු මහජන දර්ශනය ඉදිරිපත් කළ වර්ෂය කුමක් ද?
  iii. නාට්‍යයේ පළමු දර්ශනය ඇරඹෙන්නේ කිනම් උත්සවයකින් ද?
  iv. "මට හිතෙනවා ගසින් ගලින් වටවුණු
  නිල් තණකොල පිට්ටනියක දුවල දුවල දුවල යන්න
  කැරකි කැරකි දුව පනින්න" මෙසේ කියන්නේ කවුරුන් විසින් ද?
  v. මෙම නාට්‍ය ඉදිරිපත් වූ ශෛලීය නම් කරන්න.
  vi. මෙම නාට්‍යයේ සංගීතය නිර්මාණය කළේ කවුරුන් විසින් ද?
  vii. නාට්‍ය තේමාව කෙටියෙන් දක්වන්න.

02. i. රංග භූමිය යන්න පැහැදිලි කරන්න.
  ii. රංග භූමිය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
  iii. නූතන රංග භූමිය බෙදෙන ආකාරය රූප සටහනක් උපයෝගී කරගෙන පැහැදිලි කරන්න.

03. i. නාඩගම්හි මූලික ලක්ෂණ තුනක් ලියන්න.
  ii. නාඩගම් පිරිහීමට හේතු තුනක් දක්වන්න.
  iii. නාඩගම් වලින් පසුව ආ නූර්ති ශෛලියෙහි දක්නට ලැබුණු විශේෂතා සාකච්ඡා කරන්න.

04. i. මඩු ශාන්තිකර්ම යනු කුමක්දැයි හඳුන්වන්න.
  ii. වර්තමාන සමාජයේ වඩාත් අසන්නට දකින්නට ලැබෙන මඩු ශාන්තිකර්ම තුනක් නම් කරන්න.
  iii. ඉන් එකක් තෝරා එහි ඇති නාට්‍යමය අවස්ථාවනක් උදාහරණ සහිතව විග්‍රහ කරන්න.

05. i. ස්වතන්ත්‍ර, පරිවර්තන, අනුවර්තන නාට්‍ය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්දැයි වෙන වෙනම පැහැදිලි කරන්න.
  ii. එම තුන් වර්ගයටම උදාහරණ දෙක බැගින් ලියන්න.
  iii. සිරිසේන විමලවීරගේ ස්වතන්ත්‍ර නාට්‍ය තුනක් නම් කරන්න.

06. i. රූපණය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?
  ii. රංගන ශිල්පියෙකු රූපණය සඳහා සූදානම් වන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
  iii. අභිරූපණය සඳහා භාවිතා කරන ශිල්ප ක්‍රම දෙක කෙටියෙන් විස්තර කරන්න.

07. පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.

  අසල නිවෙස් දෙකකි. නිවැසියන් ජලය ලබා ගන්නේ එකම ළිඳකිනි. නිවෙස් දෙකෙහි කාන්තාවන් දෙදෙනා අතර පෙර සිටම ආරවුල් තත්ත්වයක් පැවතිණි. නමුත් එම දෙදෙනාගේ දියණියන් දෙදෙනා එකම පන්තියේ යෙහෙළියන් ය. මේ දෙදෙනාගේ මිතුරුකම නිසා දිනෙක ඇති වූ විශේෂ සිදුවීමක් හරහා කාන්තාවන් දෙදෙනා ..............

  i. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ල. 04)
  ii. සංවාද හා රංග විධාන සහිතව පෙළ රචනා කිරීම සඳහා (ල. 08)

www.edudept.up.gov.lk